# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1794/6 – 2013 ජනවාරි 21 වැනි සඳුදා – 2013.01.21**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම ගම විශාල කිරීම සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුව සුළු කොට්ඨාසයේ අළුත්නුවර ගමේ පිහිටි කෑගල්ල මැනුම් අධිකාරිගේ අංක කේර්/එම්ඩබ්එන්/99/27 හා 1997.07.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් අංක 01 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 8.050ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 01 – නිව්ලෑන්ඩ්වත්ත – ප්‍රමාණය: හෙක්. 8.050ක් පමණ**
උතුරට: දරාඬෙකුඹුර සහ නිව්ලෑන්ඩ්වත්ත; නැගෙනහිරට: නිව්ලෑන්ඩ්වත්ත සහ වතුපාර; දකුණට: නිව්ලෑන්ඩ්වත්ත, වැවකුඹුර සහ අටුගෙදරකුඹුර; බටහිරට: කහටංගෙවත්ත හෙවත් යක්වරිය, පංචියවත්තේ කුඹුරේ පිල්ලෑව, අගලකොටුවෙහේන සහ දොඹගොල්ලෙවත්ත.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 13/98/වීර්ජී/309.
ප්‍රා.ලේ. යොමු අංකය: 4/2/1/14.
2012 දෙසැම්බර් මස 18 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

02 – 216